මධ්‍යම පළාත් සභාව/ මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික මට්ටමේ

(5) **ශිල්පීය [illegible] සේවා ගණයට අයත් සේවා ව්‍යවස්ථාව**

| ඡේදය | දැනට තිබෙන පෙළ | යෝජිත පෙළ | හේතු |
|---|---|---|---|
| | III වන ශ්‍රේණියට බඳවා ගැනීම. | 111 වන ශ්‍රේණියට බඳවා ගැනීම | |
| 8.1 | මෙම සේවා ගණයට අයත් තනතුරුවල III වන පන්තියට විවෘත තරග විභාග ප්‍රතිඵල මත ඇබෑර්තු සංඛ්‍යාවෙන් 70% ක් සඳහා නව බඳවා ගැනීම් කරනු ලැබේ. | 8.1. මධ්‍යම පළාත තුළ සුදුසුකම් ඇති අයගෙන් ඉල්ලුම්පත් කැඳවා මෙම සේවා ව්‍යවස්ථාවේ 9 වන වගන්තියේ සඳහන් සුදුසුකම් සපුරාලන අය ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයකට භාජනය කර ඒ අතුරින් සුදුසුසන් තෝරාගනු ලැබේ. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 24/95 මගින් දී ඇති උපදෙස් අනුව සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය |
| 8.2 | බඳවා ගනු ලබන අවස්ථාව වන විට සේවයේ යෙදී සිටින සහ අවශ්‍ය මූලික සුදුසුකම් සපුරා ඇති පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සහ මෙම ව්‍යවස්ථාවේ 2:1 හි සඳහන් ආයතනවල සේවයේ නියුක්තව සිටින සේවකයින්ගෙන් ඇබෑර්තු සංඛ්‍යාවෙන් 30 % ක් සඳහා බඳවා ගැනීම සිදු කරනු ලැබේ. එහිදී මෙම ව්‍යවස්ථාවේ සඳහන් සේවා ගණයට අයත් සේවාවල සේවකයින් සේවයේ ස්ථිර කිරීමට අදාළව වරින් වර රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලදුව ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති චක්‍රලේඛ විධි විධාන අදාළ කර ගත යුතුය. | 8.2. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු දීමේ ක්‍රමය පහත සඳහන් පරිදි වේ.<br><br>1. ක්ෂේත්‍රයට අදාල වාචික ප්‍රශ්න - ලකුණු 50<br>11. රාජකාරි සඳහා යෝග්‍යතාවය - ලකුණු 50<br>100 | |
| 8.3 | අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හා ඒ යටතේ ඇති ආයතනවල සේවයේ යෙදී සිටින සේවක සංඛ්‍යාව ඇබෑර්තු සංඛ්‍යාවෙන් 30% ක් නොඉක්මවන හෝ ඊට අඩුවන අවස්ථාවලදී එම ඇබෑර්තු සංඛ්‍යාව විවෘත තරග විභාගයෙන් සම්පූර්ණ කෙරේ. | 8.3. ඉල්ලුම්පත් කැඳවන අවස්ථාව වනවිට තිබෙන පුරප්පාඩු ප්‍රමාණය සැලකිල්ලට ගෙන ලකුණු ප්‍රමුඛතාවය මත බඳවා ගැනීම් කරනු ලැබේ. | |
| 8.4 | යම් අවස්ථාවකදී පත් කළ යුතු සංඛ්‍යාව වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති සීමාවන්ට යටත්ව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් පවත්නා ඇබෑර්තු සංඛ්‍යාව මත තීරණය කරනු ඇත. | 8.4. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය මාණ්ඩලික නිලධාරීන් තිදෙනෙකුගෙන් සමන්විත විය යුතුය. එම නිලධාරීන් පළාත් අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගෙන් සමන්විත විය යුතුය. | |
| 8.5 | ඉල්ලුම් කිරීමේ ක්‍රමය.<br><br>විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කිරීමේ ක්‍රමය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ / පුවත්පත්වල මධ්‍යම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් පළ කරන පරිදි වේ. | | |

අනුමත කරමි / නොකරමි.

පී.බී. කොබ්බෑකඩුව
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර
200.8 - 9 - 12